# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2331/03 - 2023 මැයි මස 08 වැනි සඳුදා - 2023.05.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

වයඹ පළාත් ආණ්ඩුකාරවර නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඇ ව්‍යවස්ථාවෙන් සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2(1)(අ) වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 277(1අ) වගන්තියෙන් වයඹ පළාතේ ආණ්ඩුකාරවර අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, තුෂාර සංජීව විතාරණ යන අය කුරුණෑගල මහා නගර සභාවේ නගරාධිපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටිය දී, 252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 277(1) වගන්තියේ සඳහන් වැරදි කිසිවක් සිදු කර ඇත් දැයි පරීක්ෂා කර බලා වාර්තා කිරීම පිණිස අංක 2305/12 සහ 2022.11.09 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කළ නියමය මගින් පත් කරන ලද ඒක පුද්ගල පරීක්ෂණ කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබූ පරීක්ෂණයේ දී ඉහත කී තුෂාර සංජීව විතාරණ යන අයට එරෙහිව ඉදිරිපත් කරන ලද චෝදනා 18කින් චෝදනා 11කට වරදකරු බව තීරණය කර ඇති බව මා වෙත වාර්තා කර ඇත.

එසේම, එකී පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ස්වකීය පරීක්ෂණය කරගෙන යන අතරතුර එකී මහා නගර සභා ආඥාපනතේ 215අ වගන්තියේ සහ අංක 2199/15 හා 2020.10.29 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති 2020 මහා නගර සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ නියෝගවල විධිවිධාන ක්‍රියාත්මක වීම හේතු කොට ගෙන, එකී තුෂාර සංජීව විතාරණ යන අය 2022.12.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි කුරුණෑගල මහා නගර සභාවේ නගරාධිපති ධුරයෙන් ඉල්ලා අස් වූවා සේ සලකනු ලැබ ඇත.

තව ද, එකී වාර්තාවේ සඳහන් චෝදනා හා නිගමන පිළිබඳ සියලු ලේඛන මා විසින් නිසි ලෙස පරීක්ෂා කර අධ්‍යයනය කිරීමෙන් අනතුරුව එකී තුෂාර සංජීව විතාරණ යන අය කුරුණෑගල මහා නගර සභාවේ නගරාධිපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටිය දී, 252 අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 277(1) වගන්තියේ සඳහන් වරදවල් එකක් හෝ කිහිපයක් සිදු කර ඇති බවට තීරණය කිරීමට ප්‍රමාණවත් කරුණු ඇති බවට මා සෑහීමට පත් වී ඇත.

ඉහත කාරණා සියල්ල සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඇ ව්‍යවස්ථාවෙන් සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2(1)(අ) වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 277(1) වගන්තියෙන් වයඹ පළාතේ ආණ්ඩුකාරවර අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉහත කී තුෂාර සංජීව විතාරණ යන අය 2022.12.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි කුරුණෑගල මහා නගර සභාවේ නගරාධිපති ධූරයෙන් හා සභික ධූරයෙන් පහ කළ අයකු වශයෙන් සැලකිය යුතු බව මෙයින් නියම කරමි.

අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් **වසන්ත කරන්නාගොඩ**,
වයඹ පළාතේ ආණ්ඩුකාරවර.

2023 ක් වූ මැයි මස 04 වැනි දින,
කුරුණෑගල දී ය.

EOG 05-0007